# ගල්පොත ශිලා ලේඛනයෙන් හෙළිවන නිශ්ශංකමල්ල රජු පිළිබඳ අධ්‍යයනයක්

සී. ටී. ඒ. දිනූෂා පෙරේරා
විශේෂවේදී තෙවන වසර
ඉතිහාස අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
dinushazeerbv@gmial.com

**සංක්ෂේපය**

කාලිංග වංශික රජෙකු වූ නිශ්ශංකමල්ල රජු පොළොන්නරුවේ වසර නවයක කාලයක් රාජ්‍ය පාලනය සිදු කරන ලදි. මොහු පිළිබඳ තොරතුරු මහාවංසය ගාථා නවයකට සීමා කොට ඇත. මේ හේතුවෙන් ඔහු පිළිබඳ හැදෑරීමේදී ඔහු විසින්ම ස්ථාපනය කරන ලද ශිලා ලේඛන හැත්තෑවකට අධික සංඛ්‍යාව වැදගත් වෙයි.

මෙම පර්යේෂණයේ අරමුණු වන්නේ ගල්පොත ශිලාලේඛනයෙන් හෙළිවන රජුගේ පෞද්ගලික, දේශපාලන, ආර්ථික, සමාජ සුබසාධන හා ආගමික තොරතුරු පිළිබඳත් රටවැසියා තමාට පක්ෂපාතී කර ගැනීම සඳහා නිශ්ශංකමල්ල රජු සෙල්ලිපි පිහිටුවේ ද යන්න අධ්‍යයනයත්, ගල්පොත ශිලාලේඛනය නිශ්ශංකමල්ල රජුගේ සෙල්ලිපි සියල්ලන්ගේම සම්පිණ්ඩනයක් ද යන්න පිළිබඳවත් අධ්‍යයනය කිරීමයි. මෙහි දී ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතියික මූලාශ්‍රය කෙරෙහි අවධානය යොමු කෙරිණි.

ගල්පොත ශිලා ලේඛනය තුළින් නිශ්ශංකමල්ල රජු රජකම සඳහා තමන්ට ඇති අයිතිය තහවුරු කිරීමට උත්සහ දරා ඇත. එලෙසම පරාක්‍රමබාහු රජුගේ ජනප්‍රියත්වය අභිබවා යාමට තුලාභාර දන්දෙමින් ද, බදු සහන ලබා දෙමින් ද සොරුන්ට ජීවිත දානය ලබා දෙමින් ද, වැව් අමුණු ප්‍රතිසංස්කරණය කරමින් ද කටයුතු කළ ආකාරය ශිලා ලේඛනයේ දක්වා ඇත. නිශ්ශංකමල්ල රජු වසර නවයක රාජ්‍ය කාලය තුළ අභියෝගවලට මුහුණ දෙමින් සාර්ථක පාලනයන් ගෙන ගොස් ඇති බව එතුමා පිළිබඳ මූලාශ්‍රයගත කරුණු අධ්‍යයනයේදී පැහැදිලි විය.

**ප්‍රමුඛ පද : ගල්පොත ශිලා ලිපිය, කාලිංග වංශය, පොළොන්නරු යුගය, රාජත්වය**